# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2186/32 - 2020 ජූලි මස 31 වැනි සිකුරාදා - 2020.07.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 අගෝස්තු මස 01 වැනි දින සිට ආරම්භ වන මාස 03 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.05.07 දිනැති අංක 2174/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත අදළ නියමය 2020 අගෝස්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජූලි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5079 — 567 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 03.05 | 0305.54.10 | හාල්මැස්සන් | කි.ග්‍රෑමයට රු. 1.00 |
| 2 | | 0305.52.00<br>0305.53.00<br>0305.54.90<br>0305.59.30<br>0305.59.90 | කරවල | කි.ග්‍රෑමයට රු. 52.00 |
| 3 | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි.ග්‍රෑමයකට රු. 50.00 |
| 4 | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි.ග්‍රෑමයකට රු. 40.00 |
| 5 | 08.04 | 0804.50.50 | මැංගුස්ටීන් - අළුත් | කි.ග්‍රෑමයකට රු. 200.00 |
| | | 0804.50.60 | මැංගුස්ටීන් - වියළි | කි.ග්‍රෑමයකට රු. 200.00 |
| 6 | 08.10 | 0810.50 | කිවිප්‍රූට් | කි.ග්‍රෑමයකට රු. 175.00 |
| 7 | | 0810.90.90 | අනෙකුත් | කි.ග්‍රෑමයකට රු. 200.00 |

08 - 386

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.